# ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය
## පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය

පහත සඳහන් අධ්‍යයන වැඩසටහන් සඳහා සුදුසුකම් සපිරි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසන් දිනය 31.10.2023 වේ.

### 1. කායචිකිත්සා/පංචකර්ම පිළිබඳ විද්‍යාපති පාඨමාලා
**(Master of Science in Kayacikitsa / Pancakarma)**

ප්‍රවේශ යෝග්‍යතාවය: ඉහත පාඨමාලා හැදෑරීමට අපේක්ෂිත අයදුම්කරුවන් ඊට ප්‍රවේශවීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් පිරිනමන ලද ප්‍රථම හෝ දෙවන පංති සාමාර්ථයක් සහිතව BAMS/BUMS/BSMS උපාධිය සමත්වී තිබීම

හෝ

BAMS/BUMS/BSMS උපාධිය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම හා ආයුර්වේද / කායචිකිත්සාව පිළිබඳව අවම වශයෙන් එක් වසරකින් යුත් පශ්චාත් උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම

හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් පවත්වන ලද DSAC/DSAMS /DIMS/DAMS විභාගය ප්‍රථම හෝ දෙවන පංති සාමාර්ථයක් සහිතව සමත්වී තිබීම හා ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වීමෙන් පසු අවම වශයෙන් වසර 5 ක වෘත්තීය පළපුරුද්ද සහිත වීම

හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් පවත්වන ලද DSAC/DSAMS /DIMS/DAMS විභාගය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම හා ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වීමෙන් පසු අවම වශයෙන් වසර 5 ක වෘත්තීය පළපුරුද්ද සහිතවීම හා ආයුර්වේදය, පංචකර්ම හෝ කායචිකිත්සාව පිළිබඳ අවම වශයෙන් එක් වසරක පශ්චාත් උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම

හෝ

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ සනාතන සභාව (Senate) මගින් පිළිගනු ලබන වෙනත් සමාන සුදුසුකම් සපුරා තිබීම

අධ්‍යයන කාලය - වර්ෂ 02 කි
අධ්‍යයන මාධ්‍ය - ඉංග්‍රීසි
පාඨමාලා ගාස්තුව - රු. 400,000/-
අයදුම්පත්‍ර ගාස්තුව - රු. 2,000/-

(මෙම පාඨමාලා විදේශ පුහුණුවකින් සමන්විත වන අතර ඊට අදාළ වියදම් පාඨමාලා ගාස්තුව තුළ අන්තර්ගත නොවන බවට සලකන්න)

### 2. කායචිකිත්සා / පංචකර්ම / ශල්‍යතන්ත්‍ර පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා
**(Postgraduate Diploma in Kayacikitsa/ Pancakarma/ Shalyatantra)**

ප්‍රවේශ යෝග්‍යතාවය: ඉහත පාඨමාලා හැදෑරීමට අපේක්ෂිත අයදුම්කරුවන් ඊට ප්‍රවේශ වීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් පිරිනමන ලද BAMS/BUMS/BSMS උපාධිය සමත්වී තිබීම

හෝ

ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍යවේදය පිළිබඳව වසර 05 ක අධ්‍යයන පාඨමාලා කාර්යයන් අන්තර්ගත පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් පිරිනමන ලද (DSAC/DSAMS/DIMS/DAMS) ඩිප්ලෝමාවක් සහිතව ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වීමෙන් පසු අවම වශයෙන් වසර 05 ක වෘත්තීය පළපුරුද්දක් තිබීම

හෝ

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ සනාතන සභාව (Senate) මගින් පිළිගනු ලබන වෙනත් සමාන සුදුසුකම් සපුරා තිබීම.

අධ්‍යයන කාලය - වර්ෂ 01 කි
අධ්‍යයන මාධ්‍ය - ඉංග්‍රීසි
පාඨමාලා ගාස්තුව - රු. 300,000/-
අයදුම්පත්‍ර ගාස්තුව - රු. 2,000/-

(මෙම පාඨමාලා විදේශ පුහුණුවකින් සමන්විත වන අතර ඊට අදාළ වියදම් පාඨමාලා ගාස්තුව තුළ අන්තර්ගත නොවන බවට සලකන්න)

### 3. ආයුර්වේද ආයතන කළමනාකරණය සහ පරිපාලනය පිළිබඳ විද්‍යාපති / පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා
**(Master of Science/Postgraduate Diploma in Management and Administration of Ayurveda Institutions)**

ප්‍රවේශ යෝග්‍යතාවය: ඉහත පාඨමාලාව හැදෑරීමට අපේක්ෂිත අයදුම්කරුවන් ඊට ප්‍රවේශ වීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් පිරිනමන ලද BAMS/ BUMS/BSMS උපාධිය සමත්වී තිබීම

හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් පිරිනමන ලද DSAC/DSAMS/DIMS/DAMS විභාගය සමත්වී තිබීම හා ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වීමෙන් පසු අවම වශයෙන් වසර 05 ක වෘත්තීය පළපුරුද්දක් තිබීම

හෝ

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ සනාතන සභාව (Senate) මගින් පිළිගනු ලබන වෙනත් සමාන සුදුසුකම් සපුරා තිබීම.

අධ්‍යයන කාලය - පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව - වර්ෂ 01 කි
විද්‍යාපති පාඨමාලාව - වර්ෂ 02 කි
අධ්‍යයන මාධ්‍ය - ඉංග්‍රීසි
පාඨමාලා ගාස්තුව - පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව - රු. 250,000/-
- විද්‍යාපති පාඨමාලාව - රු. 350,000/-
අයදුම්පත්‍ර ගාස්තුව - රු. 2,000/-

(මෙම පාඨමාලා විදේශ පුහුණුවකින් සමන්විත වන අතර ඊට අදාළ වියදම් පාඨමාලා ගාස්තුව තුළ අන්තර්ගත නොවන බවට සලකන්න.)

### 4. යෝග විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව
**(Postgraduate Diploma in Yoga Science)**

ප්‍රවේශ යෝග්‍යතාවය: ඉහත පාඨමාලාව හැදෑරීමට අපේක්ෂිත අයදුම්කරුවන් ඊට ප්‍රවේශ වීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් පිරිනමන ලද BAMS/BUMS/BSMS/B.Sc/B.A/MBBS උපාධියක් හෝ වෙනත් උපාධියක් සමත්වී තිබීම

හෝ

ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍යවේදය පිළිබඳව වසර 05 ක අධ්‍යයන පාඨමාලා කාර්යයන් අන්තර්ගත පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ උසස් අධ්‍යාපන ආයතනයකින් පිරිනමන ලද (DSAC/DSAMS/DIMS/DAMS) ඩිප්ලෝමාවක් සහිතව ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වීමෙන් පසු අවම වශයෙන් වසර 05 ක වෘත්තීය පළපුරුද්දක් තිබීම

හෝ

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ සනාතන සභාව (Senate) මගින් පිළිගනු ලබන වෙනත් සමාන සුදුසුකම් සපුරා තිබීම.

අධ්‍යයන කාලය - වර්ෂ 01 කි
අධ්‍යයන මාධ්‍ය - ඉංග්‍රීසි
පාඨමාලා ගාස්තුව - රු.250,000/-
අයදුම්පත්‍ර ගාස්තුව - රු.2,000/-

### 5. යෝග සහ සංයමය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
**(Diploma in Yoga and Relaxation)**

ප්‍රවේශ යෝග්‍යතාවය: යෝග සහ සංයම අභ්‍යාස පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

අධ්‍යයන කාලය - වර්ෂ 01 කි
අධ්‍යයන මාධ්‍ය - සිංහල
පාඨමාලා ගාස්තුව - රු.125,000/-
අයදුම්පත්‍ර ගාස්තුව - රු.2,000/-

### 6. යෝග සහ සංයම අභ්‍යාස පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
**(Certificate Course in Yoga and Relaxation Techniques)**

ප්‍රවේශ යෝග්‍යතාවය: උනන්දුවක් දක්වන ඕනෑම අයෙකුට සහභාගී විය හැකිය. විශේෂ සුදුසුකම් අවශ්‍ය නොවේ.

අධ්‍යයන කාලය - මාස 03 කි
අධ්‍යයන මාධ්‍ය - සිංහල
පාඨමාලා ගාස්තුව - රු. 30,000/-
අයදුම්පත්‍ර ගාස්තුව - රු.2,000/-

අයදුම් කරනු ලබන්නේ කෙසේද: නියම කර ඇති අයදුම්පත් විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවිය වන **https://gwu.ac.lk/fgs/index.php** මගින් බාගත (download) කළ හැකිය.

**අයදුම්පත්‍ර ගාස්තුව රාජකාරී දිනයන්හි පෙ.ව. 9.00 - ප.ව. 3.00 අතර කාලය තුළ විශ්වවිද්‍යාලයේ මුදල් අයකැමි වෙත ගෙවිය හැකිය.** එසේ නොමැති නම් අයදුම්කරුවන් විසින් ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ ජංගම ගිණුමට (ගිණුම් අංක 333-1002-00000059 - මහජන බැංකුව, යක්කල) බැර වන පරිදි අදාළ අයදුම්පත්‍ර ගාස්තුව දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකට ගෙවිය හැකිය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග ගෙවීම්පත (Original payment slip) සහකාර ලේඛකාධිකාරී, පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, නුවර පාර, යක්කල යන ලිපිනයට එවිය යුතුයි. (ගෙවීම් පතෙහි පිටපතක් ළඟ තබා ගත යුතුයි)

**අයදුම් කරන පාඨමාලාවේ නම එවනු ලබන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි සඳහන් කළ යුතු වේ.**

නිසිලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් 31. 10. 2023 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුයි. අසම්පූර්ණ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේඛකාධිකාරී**
**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය,**
**නුවර පාර, යක්කල**

දුරකථන අංකය : 033 - 2222748 (Ext. 307) / 033 - 2215851 ෆැක්ස් අංකය : 033 - 2215772